# (ඊ) ජාත්‍යන්තර ගනුදෙනු හා විදේශීය වත්කම්

ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු හා විදේශීය වත්කම් පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යා තොරතුරු දෙවැනි පරිශිෂ්ටයේ 27 සිට 31 තෙක් වූ සංඛ්‍යා සටහන් වලින් දක්වෙයි. ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ සංඛ්‍යා තොරතුරු සකස් කර ගෙන ඇත්තේ විනිමය පාලන වාර්තා වලින් ලබා ගන්නා ලද නියම ලැබීම් හා ගෙවීම් සංඛ්‍යා අනුවය.

**ප්‍රධාන හැඩ ගැස්ම**

1965 දී ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු වල සාමාන්‍ය හැඩ ගැස්ම කලින් වර්ෂ කීපය තුළ පැවැති පිළිවෙලට වඩා වෙනස් විය. 1962 හා 1964 දී 'අදිසි ගිණුමේ' අතරින් පතර ඇති වූ අතිරික්තයන් හැරුණු විට ලංකාවේ 'වෙළෙඳ භාණ්ඩ' හා අදිසි ගිණුම් වල ද, මූලික ශේෂයෙහි ද[1] දිගින් දිගටම හිඟයන් ඇති විය. එහෙත් 1964 දී[2] වෙළෙඳ භාණ්ඩ ගිණුමේ රුපියල් කෝටි 19.3 ක හිඟයක් ඇති වුව ද, 1965 දී ඇති වූයේ රුපියල් කෝටි 0.5 ක හිඟයක් පමණෙකි. එසේම, 1964 දී අදිසි ගිණුම් ශේෂයෙහි (භාණ්ඩ වලින් ලැබුණු ත්‍යාග ඇතුළත් වූ) රුපියල් කෝටි 3.3 ක අතිරික්තයක් වූ අතර, 1965 දී එය රුපියල් කෝටි 5.2 ක් දක්වා වැඩි විය. මේ අයුරින් 'වෙළෙඳ භාණ්ඩ හා අදිසි' ගිණුම් වල ඇති වූ දියුණුව නිසා 1964 දී ජාත්‍යන්තර ගනුදෙනු වල වර්තන ගිණුමේ රුපියල් කෝටි 16.0 ක හිඟයක් වුව ද, 1965 දී රුපියල් කෝටි 4.7 ක අතිරික්තයක් ඇති විය. වාණිජ හා දිගු කාලීන ප්‍රාග්ධන ගනුදෙනු වල තත්ත්වය පිළිබිඹු කරන මූලික ශේෂයෙහි, 1964 දී රුපියල් කෝටි 9.2 ක හිඟයක් ඇති වූ නමුදු, 1965 දී රුපියල් කෝටි 10.6 ක අතිරික්තයක් ඇති විය. මේ හේතුවෙන් 1965 දී ලංකාවේ විදේශීය වත්කම් (රන් පවුම් ණය නිදන් අරමුදල් හැර) රුපියල් කෝටි 10.3 කින් රුපියල් කෝටි 40.8 දක්වා වැඩි විය. 1964 දී විදේශීය වත්කම් රුපියල් කෝටි 5.4 කින් අඩු විය. 1965 වසරේ විදේශීය වත්කම් වැඩිවීමෙන්, අනෙකුත් කරුණු අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් රුපියල් කෝටි 5.34 ක් (ශුද්ධ) පිළිබිඹු වෙයි. මෙම වැඩිවීමට තරමක් දුරට හේතු වූ තවත් කරුණක් නම් ලාභ හා ලාභාංශ ප්‍රේෂණ කල් දැමීමේ බලය, සංශෝධන ස්වරූපයකින් වුවද, නොකඩවා පවත්වාගෙන යාමය. 1965 දී වෙළෙඳ තත්ත්වය වාසි සහගතව පෙනුනේ වුවද, ආනයන සඳහා බලපත්‍ර වැඩිහරියක් 1965 වසරේ අවසන් කාර්තුව තුළද නිකුත් කැරුනෙන් ඒ සඳහා කැරෙන ගෙවුම් සමාලෝචනයට භාජනය වූ කාලච්ඡේදය තුළ මුළුමනින් පිළිබිඹු නොවීම නිසා වෙළෙඳ වාසිය ඒ අයුරින් ම ගත යුතු නොවේ. එසේ ම, මේ වාසිදයක වෙළෙඳ තත්ත්වය ඇති වූයේ ද අර්ථ ක්‍රමයෙහි පරිත්‍යාගයක් ඇති නොකරමින් ම නොවේ. 1965 වර්ෂය අවසානය හරියේදී භාණ්ඩ හිඟය වැඩි වූ අතර, භාණ්ඩ බොහොමයක මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අවස්ථාවේ මහ බැංකුව ද්විපාර්ශ්වීය ආධාර ගිවිසුම්හි තීරණයක් ලැබෙන තුරු රුපියල් කෝටි 3.5 ක ආනයන බලපත්‍ර නිකුත් කිරීමට බලය දෙන ලදී.

**වෙළෙඳ භාණ්ඩ ගිණුම**

ලංකාවේ වෙළෙඳ භාණ්ඩ ගිණුම් ශේෂය (වෙළෙඳ ගනුදෙනු හා විදේශාධාර වලින් ගනුදෙනු ඇතුළුව) 1965 දී රුපියල් කෝටි 0.5 ක හිඟයක් පෙන්නුම් කෙළේය. 1964 දී එහි රුපියල් කෝටි 19.3 ක හිඟයක් ඇති විය. 1964 දී

1. වර්තන හා ප්‍රාග්ධන ගිණුම් එකිනෙකට හිලව් කිරීමෙන් පසු ජාත්‍යන්තර ගනුදෙනු වල ශුද්ධ තත්ත්වය.
2. ආධාර ගිවිසුම් අනුව කැරෙන භාණ්ඩ ආනයන හළවිට ලංකාවේ වෙළෙඳ ගනුදෙනු හේතු කොට ගෙන නියම වෙළෙඳ ශේෂයෙහි ඇති වූ අතිරික්තය රුපියල් කෝටි 13.2 ක් විය. 1964 දී එහි රුපියල් කෝටි 3.9 ක හිඟයක් ඇති විය.

## සංඛ්‍යා සටහන II (ඊ) 1

## ලංකාවේ ජාත්‍යන්තර ගණුදෙනු (අ)

(රුපියල් දශලක්ෂ)

| වර්ෂය | (1) අපනයන (මුළු) | (2) ආනයන (මුළු) | (3) වෙළෙඳ ශේෂය (i) (එකතුව) | (ii) එයින් වෙළෙඳ ගනුදෙනු (ආ) | (4) ශුද්ධ අදිසි | (5) වර්තන ගිණුමේ ශේෂය (3 (i) සහ 4 එකතුව) | (6) දිගු කාලීන ප්‍රාග්ධන (ඇ) | (7) මූලික ශේෂය (5 සහ 6 එකතුව) | (8) කෙටිකාලීන ප්‍රාග්ධන (ශුද්ධ) (ඈ) | (9) වැරදීම් හා අත්හැරීම් | (10) විදේශීය වත්කම්හි වෙනස (වැඩිවීම) + | (11) කාලච්ඡේදය අවසානයේදී මුළු විදේශීය වත්කම් | (12) වත්කම් (රන් පවුම් ණය නිදන් අරමුදල් අත්හැර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1957 .. | 1,669 | 1,764 | – 95 | ( – 45) | – 100 | – 195 | –18 | – 213 | – 1 | – | – 214 | 1,062 | 973 |
| 1958 .. | 1,624 | 1,713 | – 89 | ( – 11) | – 64 | – 153 | + 8 | – 145 | +32 | – 16 | – 129 | 933 | 838 |
| 1959 .. | 1,773 | 1,958 | – 185 | ( – 49) | – 23 | – 208 | +32 (ඉ) | – 176 | – | + 1 | – 175(ඉ) | 734 | 655 |
| 1960 .. | 1,796 | 2,006 | – 210 | ( –127) | – 10 | – 220 | +22 | – 198 | –24 | + 29 | – 193 | 541 | 458 |
| 1961 .. | 1,707 | 1,794 | – 87 | ( – 5) | – 7 | – 95 | +11 | – 84 | +93 (ඊ) | – 19 | – 9 | 532 | 441 |
| 1962 .. | 1,763 | 1,906 | – 143 | ( – 47) | + 3 | – 140 | +39 | – 101 | +42 (ඊ) | + 31 | – 28 | 504 | 407 |
| 1963 .. | 1,708 | 1,869 | – 161 | ( – 27) | – 7 | – 168 | +80 | – 88 | +42 | + 4 | – 42 | 462 | 359 |
| 1964 .. | 1,767 | 1,960 | – 193 | ( – 39) | + 33 | – 160 | +69(ඉ) | – 92 | +33 | – 8 | – 51(ඉ) | 351 | 305 |
| 1965 (g). | 1,911 | 1,916 | – 5 | (+132) | + 52 | – 47 | +59(ඉ) | – 106 | + 1 (ඊ) | + 8 | + 114(ඉ) | 440 | 408 |

(අ) ලැබී ඇති හා ගෙවා ඇති විනිමය අනුව සකසා ඇති විනිමය පාලන සංඛ්‍යා තොරතුරු අනුව.

(ආ) පහත සඳහන් ද ඇතුළත්ය. (1) වෙළෙඳ බැංකුවල විදේශීය විනිමය ගනුදෙනු, (1) වෙළෙඳ බැංකු බහිවාසික ගිණුම් (3) මහ බැංකුවේ විනිමය ගනුදෙනු, (4) ගෙවුම් ගිවිසුම් ගනුදෙනු සහ (5) විශේෂ ගිණුම් පහසුකම් භුක්ති විඳින සමාගම් (එනම් රන් පවුම් වැවිලි සමාගම් සහ වෙළෙඳ ගිණුම්) මගින් කරනු ලබන ගනුදෙනු.

(ඇ) පෞද්ගලික සහ රජයේ දිගු කාලීන ප්‍රාග්ධන සංචලනයේ (ශුද්ධ) ඇතුළත්වේ. බැර ශේෂය මෙසේය. 1957 රුපියල් කෝටි 23, 1959 රුපියල් කෝටි 41, 1960 රුපියල් කෝටි 27, 1961 රුපියල් කෝටි 24, 1962 රුපියල් කෝටි 46, 1963 රුපියල් කෝටි 82, 1964 රුපියල් කෝටි 7·9 සහ 1965 රුපියල් කෝටි ·72 මේ සංඛ්‍යා වලින් ජා. ප්‍ර ස බැ., ඇ. එ. ජ. කැනඩා, ජර්මන් ඒකාබද්ධ සමූහාණ්ඩුව, එ. ස. සෝ ස., චීනය, එක්සත් රාජධානිය ආදී රටවල දිගු කාලීන ණය වලින් ගනු ලැබූ ප්‍රමාණයෙන් පිළිබිඹු වෙයි.

(ඈ) ද්විපාර්ශවීය වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම් යටතේ වගකීම්වල වෙනස් වීමද, ජනනීති 480 ප්‍රතිපාර්ශවීය අරමුදල් වෙළෙඳ බැංකු විදේශියට ඇති වගකීම් හා අර මුදලෙන් ගන්නා මුදල් ඇතුළත් වෙයි. 1964 සහ 1965 සංඛ්‍යාවනට සහල් ආනයනය සඳහා බුරුමයට දිය යුතු ප්‍රමාණය ඇතුළත් වෙයි.

(ඉ) 1959 රුපියල් කෝටි 2–4 ක් ද, 1964 රුපියල් කෝටි 6·0 ක් ද, 1965 රුපියල් කෝටි 2·5 ක් ද වශයෙන් ආපසු ගෙවන ලද රන් පවුම් ණය ඇතුළත් නොවේ. මේවා ප්‍රධාන වශයෙන් එකතුවන රන් පවුම් ණය නිදන් අරමුදල් වලින් බේරන ලදී.

(ඊ) 1961 සහ 1962 දී රුපියල් කෝටි 5·38 බැගින් හා 1965 දී රුපියල් කෝටි 10·94 ක් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් මුදල් ඇතුලත්ය. එයින්, කලින් ලබා ගන්නා ලදුව බේරූ රුපියල් කෝටි 3·57 ක් සහ ලංකාවේ සලාකය ඩොලර් කෝටි 4·5 (රුපියල් කෝටි 21·42) සිට ඩොලර් කෝටි 6·2 (රුපියල් කෝටි 29·51) දක්වා වැඩිවීම නිසාවූ රුපියල් කෝටි 2·02 රත්රන් දීමනාව අඩුකොට ඇත.

උ) තාවකාලිකයි

රුපියල් කෝටි 176·7 ක් වූ අපනයන වටිනාකම 1965 දී රුපියල් කෝටි 191·1 දක්වා ඉහළ ගියේය. ආනයන වටිනාකම 1964 දී රුපියල් කෝටි 196·0 ක් වූ අතර, 1965 දී රුපියල් කෝටි 191·6 දක්වා පහළ වැටිණි. ආධාර වලින් කැරෙන ආනයන වල වටිනාකම 1964 රුපියල් කෝටි 15·49 වූයේ, 1965 දී රුපියල් කෝටි 13·72 දක්වා අඩු විය. එසේ ම, ආධාර වලින් නොවන ආනයන වල වටිනාකම 1964 දී රුපියල් කෝටි 180·52 සිට 1965 දී රුපියල් කෝටි 177·90 දක්වා පහළ වැටිණි

1965 දී වෙළෙඳ තත්ත්වය වාසිදායක වීමෙහිලා බල පෑ ප්‍රධාන සාධක වූයේ, අපනයන පරිමාව සැලකිය යුතු ලෙස වැඩිවීමය. ඒ සමගම ආනයන පරිමාව පහළ වැටීමත්ය. අපනයන පරිමාව වැඩිකර ගතහැකි වූයේ ලංකාවේ ප්‍රධාන අපනයන ද්‍රව්‍ය, විශේෂයෙන් ම, තේ, නිපැයුම වැඩි වීමේ හේතුවෙනි. 1964 දී 111 ක් වූ තේ අපනයන පරිමා දර්ශකය, 1965 දී 120 තෙක් ඉහළ නැංගේය. රබර් හා රබර් කිරි අපනයන පරිමාව ද වැඩි වූයේ, 1964දී 120 ක් වූ දර්ශක අංකය, 1965 දී 137 දක්වා ඉහළ ගියේය. එහෙත්, 1965 දී පොල් නිෂ්පාදිත හා දහ අට වැදෑරුම් සුළු නිෂ්පාදිත අපනයන පරිමාවන් සැලකිය යුතු ලෙස අඩු වූයේ, ඒ දර්ශක අංකයන් පිළිවෙළින් 1964 රේ 181 සිට 1965 දී 142 දක්වා ද, 1964 රේ 126 සිට 1965 දී 103 දක්වා ද පහළ වැටිණි.

1965 දී තේ අපනයන පරිමාව වැඩිවීමෙන් ඇති වූ වාසිදායක තත්ත්වය තේ මිල අඩුවීම නිසා තරමක් බාල විය. 1964 දී 91 වූ තේ අපනයන මිල දර්ශකය 1965 දී 89 දක්වා අංක දෙකකින් පහළ වැටිණි. එහෙත් රබර් අපනයන මිල දර්ශකය 1965 දී සාමාන්‍යයෙන් නොවෙනස්ව පැවතිණි. පොල් නිෂ්පාදිත අපනයන පරිමාව අඩු වූයේ වුවද, මිල සාමාන්‍යයෙහි වැඩිවීමකින් එය තරමක් දුරට හිලව් විය. පොල් නිෂ්පාදිත මිල දර්ශකය 1964 දී 93 ක් වූ අතර, 1965 දී 119 දක්වා ඉහළ නැංගේය. අනෙකුත් සුළු නිෂ්පාදිත අපනයන මිල දර්ශකය 1964 දී 114 ක් වූයේ 1965 දී 117 දක්වා ඉහළ ගියේය.

1965 දී ආනයනය කැරුන වෙළෙඳ භාණ්ඩ වල මුළු වටිනාකම රුපියල් කෝටි 191·6 ක් විය. 1964 දී මෙය රුපියල් කෝටි 196·0 ක් විය. 1965 වටිනාකමෙන් රුපියල් කෝටි 64·65 ක් රජයේ ආනයන සඳහා විය. ඉකුත් වසරේදීට වඩා මෙය සුළු වැඩිවීමකි. පෞද්ගලික අංශයේ හා රජයේ සමායතන වල ආනයන, රුපියල් කෝටි 115·77 ක් විය. මෙය ඉකුත් වසරේදීට වඩා රුපියල් කෝටි 3·55 කින් අඩුය. 1965 සහල් ආනයන සඳහා ගෙවූ ප්‍රමාණය 1964 දීට වඩා රුපියල් කෝටි 3·26 කින් වැඩි වූයේ, රුපියල් කෝටි 26·78 ක් විය. පිටි ආනයන වටිනාකම රුපියල් කෝටි 1·21 කින් රුපියල් කෝටි 82·8 තෙක් වැඩි විය සීනි වල ජාත්‍යන්තර මිල අඩු වූයේ, සීනි ආනයනයේ වටිනාකම රුපියල් කෝටි 16·19 සිට රුපියල් කෝටි 8·68 කින්, රුපියල් කෝටි 7·51 දක්වා අඩු විය.

1965 දී ණය මාර්ගයෙන් කැරුන ආනයන වල වටිනාකම රුපියල් කෝටි 7·72 ක් විය. 1964 දී මෙම මාර්ගයෙන් රුපියල් කෝටි 7·84 ක ආනයන කැරිණි. 1965 දී ද්‍රව්‍ය වලින් මෙරටට කැරුන දීමනා වල වටිනාකම රුපියල් කෝටි 6·0 ක් විය. 1964 දී එසේ දෙන ලද ප්‍රමාණය රුපියල් කෝටි 7·64 ක් විය. 1965 ආනයන වලට ඇතුලත් වූ ණය කොටියාශය ප්‍රධාන වශයෙන් සමන්විත වූයේ විවිධ සංවර්ධන ව්‍යාපාරයන් සඳහා ලෝක බැංකුවෙන් (රුපියල් කෝටි 1·05), සෝ. ස. ස. සංගමයෙන් (රුපියල් කෝටි 2·3), කැනඩාවෙන් (රුපියල් කෝටි 1·24), බටහිර ජර්මනියෙන් (රුපියල් කෝටි 1·0), චීනයෙන් (රුපියල් කෝටි 0·95) හා ප්‍රංශයෙන් (රුපියල් කෝටි 0·64) ප්‍රතිපාදිත මුදල් යටතේ කැරුන ගෙවීම් වලිනි. ද්‍රව්‍ය වලින් කැරුන දීමනා වලට, ප්‍රධාන වශයෙන්ම, කැනඩාවෙන් හා ඕස්ට්‍රේලියාවෙන් දුන් තිරිඟු පිටි හා ඇමෙරිකාවෙන් දුන් කෙයාර් පිටි හා කිරි ඇතුළත් විය.

සංඛ්‍යා සටහන II (ඊ) 2

**1964 සහ 1965 ජංගම අදිසි**

රුපියල් දශලක්ෂ

| | 1964 | | | 1965 | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **සේවා** | **181·9** | **189·1** | **– 7·2** | **185·7** | **169·7** | **+16·0** |
| මුදල් නොවන රන් සංචලන (ශුද්ධ) | – | 1·6 | – 1·6 | – | 1·8 | – 1·8 |
| ප්‍රවාහණය | 102·5 | 33·9 | +68·6 | 103·8 | 28·9 | +74·9 |
| සංචාර | 5·5 | 14·3 | – 8·8 | 5·7 | 12·9 | – 7·2 |
| ආයෝජන ආදයම | 11·6 | 47·3 | –35·7 | 13·0 | 28·2 | –15·2 |
| රජයේ වියදම් | 26·0 | 25·2 | + 0·8 | 28·9 | 25·3 | + 3·6 |
| අනෙකුත් සේවා | 36·3 | 66·8 | –30·5 | 34·3 | 72·6 | –38·3 |
| **සංක්‍රාම ගෙවුම්** | **82·8** | **42·7** | **+40·1** | **67·3** | **31·5** | **+35·8** |
| පෞද්ගලික ගෙවුම් | 6·4 | 42·7 | –36·3 | 7·3 | 31·5 | –24·2 |
| රාජකාරි | 76·4 | – | +76·4 | 60·0 | – | +60·0 |
| **එකතුව** | **264·7** | **231·8** | **+32·9** | **253·0** | **201·2** | **+51·8** |

1965 වසරේ දී ලංකාවේ අදිසි ගිණුමේ ශේෂයෙහි දියුණුවක් පිළිබිඹු කරමින් රුපියල් කෝටි 5·18 ක අතිරික්තයක් ඇති විය. 1964 දී එහි රුපියල් කෝටි 3·29 ක අතිරික්තයක් වූ අතර, 1963 දී රුපියල් කෝටි 0·66 ක හිගයක් ඇති විය. 1965 දී ලැබුණු දීමනාවල වටිනාකම 1966 දී ලැබුන ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 1·64 කින් අඩු වී ඇති බව සලකන විට, අදිසි ගිණුමේ දියුණුවට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ආයෝජන ආදායමෙන් කැරුන ප්‍රේෂණ අඩුවීමය. මෙසේ වූයේ රුපියල් කෝටි 0·2 ක මුදලක් යැවීමට ඉඩදීම හැරුණු කොට, ප්‍රේෂණ කල් තැබීමේ බලය නොකඩවා පවත්වාගෙන යාමත්, පිටරට සිටින යැපෙන්නන් ගේ නඩත්තුව හා සංක්‍රමිකයන්ගේ ප්‍රේෂණ වශයෙන් යැවිය හැකි ප්‍රමාණය අඩු කිරීමේ හේතුවෙන් පෞද්ගලික පැවැරුම් වල හිගය රුපියල් කෝටි 1·21 කින් අඩුවීමත් නිසාය. 1965 දී ප්‍රධාන වශයෙන්ම ප්‍රමාද ගාස්තු අඩුවීමේ හේතුවෙන් අදිසි ශේෂයේ ප්‍රවාහන ගිණුමේ අතිරික්තය වැඩි විය. සංචාරකයන්ගෙන් මෙරටට ලැබුන ආදායම වැඩි වූයේ ඉතා සුළු ප්‍රමාණයකිනි.

**දළ රාජ්‍ය විදේශීය වගකීම්**

සංඛ්‍යා සටහන II (ඊ) 3

**ලංකාවේ රාජ්‍ය විදේශීය වගකීම්[1] (දළ)**

(රුපියල් දශලක්ෂ)

| | වර්ෂයේ අවසානයට ගෙවීමට ඇති | | |
|---|---|---|---|
| | 1964 | 1965 | වෙනස |
| 1. ලංකාවෙන් අයවිය යුතු ගෙවීම් ගිවිසුම් ශේෂ .. | 69·3 | 0·7 | —68·6 |
| 2. ජා. මු. අරමුදලෙන් ගත් ණය .. | 107·6 | 181·3 | +73·7(2) |
| 3. රන් පවුම් ණය .. | 107·9 | 83·3 | —24·6 |
| 4. ණයට ගෙන පියවා නොමැති අනෙකුත් විදේශීය ණය(3) .. | 330·6 | 391·6 | +61·0 |
| 5. පමාකළ ගෙවුම් (සහල්) .. | 37·3 | 60·3(4) | +23·0 |
| එකතුව .. | **652·7** | **717·2** | **+64·5** |

(1) විදේශීය විනිමය වලින් ගෙවීමට ඇති වගකීම් වලට ජන නීති 480 යටතේ ඇති ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ශේෂ සහ වෙළෙඳ බැංකු වෙතැති අනේවාසික ශේෂ ඇතුළත් නොවේ. එවැනි ශේෂ 1965 දී රුපියල් කෝටි 8·90 සිට රුපියල් කෝටි 9·49 දක්වා රුපියල් කෝටි 0·59 කින් වැඩිවිය.

(2) රුපියල් කෝටි 10·94 ක ණය ගැනීම් සහ රුපියල් කෝටි 3·57 ක ආපසු ගෙවීම් අයත් වෙයි.

(3) ජා. ප්‍ර. ස. බැංකුව, අමෙරිකා එක්සත් ජනපදය, සෝවියට් සංගමය, චීනය, බටහිර ජර්මනිය, කැනඩාව යනාදීයෙන් ගන්නා ලද ණය මුදල් මෙයට අයත් වෙයි.

(4) තාවකාලිකයි.

1965 දී ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු වල වර්තන ගිණුමෙහි රුපියල් කෝටි 4·7 ක අතිරික්තයක් ඇති විය. 1964 දී එහි රුපියල් කෝටි 16·0 ක හිඟයක් ඇති විය. පිටරට මුදල් තත්ත්වය ශක්තිමත් කිරීමේ අටියෙන් හා විශේෂයෙන්ම ලැබීම් හා ගෙවීම් වල ඇති වන බලාපොරොත්තු නොවූ උච්චාවචනයට මුහුණ දීමට හැකිවනු සඳහා සෑහෙන තරමක සංචිතයක් ගොඩනැගීමේ අටියෙන් 1965 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ගනුදෙනු කීපයක් ම නිමා කැරිණි. 1965 මාර්තු මාසයේ දී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් කෝටි 0·375 කට සමාන මුදලක් (රුපියල් කෝටි 1·79 ක්) නැවත මිලයට ගන්නා ලදී. මෙය 1961 අප්‍රේල් මාසයේ දී අරමුදලෙන් කොටස් තුනකට නැවත මිලයට ගැනීමට ගිවිසගත් ඩොලර් කෝටි 1·125 ක් වූ (රුපියල් කෝටි 5·38) මුදලෙන් පළමු වැනි කොටස විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 1963 පෙබරවාරි 27 වැනි දින සම්මත කරගත්, 'අපනයන උච්චාවචනයනට මුහුණ පෑම සඳහා මුදල් ලබාදීමේ' තීරණය අනුව ලංකාව අරමුදලට ගෙවිය යුතු සාමාජික මුදල 1965 අප්‍රේල් 7 වැනි දින සිට ඩොලර් කෝටි 6·2 (රුපියල් කෝටි 29·51) දක්වා වැඩි කරන ලදී. වැඩි කළ මුදලෙන් සියයට 25 ක් (ඩොලර් කෝටි 0·425 ක්) හෙවත් (රුපියල් කෝටි 2·02) 1965 මැයි මාසයේ දී රත්රන් වලින් ගෙවන ලදී. 1965 අප්‍රේල් මාසයේ දී ලංකාව අරමුදලෙන් ඩොලර් කෝටි 0·8 ක් (රුපියල් කෝටි 3·82) මිලට ගත්තේය. ඩොලර් කෝටි 3·0 ක (රුපියල් කෝටි 14·28) සම්පස්ථ අරමුදල් වශයෙන් යොදුගත් වැඩ පිළිවෙලක මුල් කොටස වශයෙන් 1965 ජූලි මාසයේදී තවත් ඩොලර් කෝටි 1·5 ක (රුපියල් කෝටි 7·13 ක) මුදලක් විවිධ ව්‍යවහාර මුදල් වර්ග වලින් ජා. මූ. අරමුදලෙන් මිලට ගන්නා ලදී. එසේ ම, 1961 අප්‍රේල් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ගනුලැබූ ඩොලර් කෝටි. 1·125 න් (රුපියල් කෝටි 5·38) නැවත මිලයට ගැනීමට පැවැති දෙවැනි කොටස වශයෙන් වූ ඩොලර් කෝටි 0·375 ක් (රු. කෝටි 1·79) 1965 ඔක්තෝබර් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලංකාව නැවත මිලයට ගන්නා ලදී. මෙකී ගනුදෙනු හේතු කොට ගෙන මුළු වශයෙන් ඩොලර් කෝටි 1·12 ක් (රුපියල් කෝටි 5·34 ක) විදේශීය මුදලක් ලැබිණි. අරමුදල සමග කැරුන මෙකී ගනුදෙනු වලට අමතරව 1965 වසර සඳහා බෙහෙවින් අවශ්‍ය වූ මුදල් තාවකාලික වශයෙන් ලබා ගැනීම පිණිස විදේශීය වෙළෙඳ බැංකු සමග ද කෙටි කාලීන විධිවිධාන යොදු ගනු ලැබිණි.

1965 දී රට තුළට ඇදී ආ දිගු කාලීන නිල ප්‍රාග්ධනය (ශුඩ) රුපියල් කෝටි 6·1 ක් විය. 1964 දී එය රුපියල් කෝටි 6·74 ක් විය. 1965 දී රුපියල් කෝටි 7·72 ක් ණයට ගත් අතර, ගෙවන ලද ණය (රන් පවුම් ණය තිදන් අරමුදල් වලින් කැරුන ගෙවීම් හැර) රුපියල් කෝටි 1·62 ක් විය. ඉහත සඳහන් කළ පරිදි 1965 වසර තුළ ලැබුණ ණය මුදල් විවිධ සංවර්ධන ව්‍යාපාර සඳහා යොදවන ලදී. ලෝක බැංකුවෙන් ලැබුණ ණය ග්‍රෑන්ඩ්පාස්හි දෙවැනි තාප බල මධ්‍යස්ථානයේ කටයුතු සඳහා උපයෝගී කොට ගන්නා ලදී. සෝ. ස. ස. සංගමයෙන් ලැබුණු ණය ප්‍රධාන වශයෙන්ම, මෝටර් කාර් ටයර් හා ටියුබ් නිපදවීමේ කම්හලක් පිහිටුවීම සඳහා යොදවන ලදී. කැනේඩියානු ණය, මස්කෙළි ඔය නිම්න සංවර්ධන ක්‍රමය සඳහා ද බටහිර ජර්මනියෙන් ලැබුණ ණය ලංකා සිමෙන්ති කම්හලේ කටයුතු හා වරාය සංවර්ධන කටයුතු සඳහා ද යොදවන ලදී. චීනයෙන් ලැබුන ආධාර ප්‍රධාන වශයෙන් ම රෙදිපිළි කර්මාන්තය සඳහා යොදවනු ලැබූ අතර, ප්‍රංශයෙන් ලැබුන ආධාර මහනුවර ජල සම්පාදන ක්‍රමය සඳහා යොදවන ලදී. එක්සත් රාජධානියෙන් ලැබුන රුපියල් කෝටි 0·23 ක ණයක් ටැලිපෝන් උපකරණ සඳහා උපයෝගී කර ගන්නා ලදී.

1965 අවසානයේදී පැවැති කෙටි කාලීන වගකීම් තත්ත්වය අනුව ගෙවීම් ගිවිසුම් රටවල් සමග කැරුන ගනුදෙනු හේතු කොට ගෙන ලංකාවේ වගකීම් රුපියල් කෝටි 6·86 කින් රුපියල් කෝටි 0·07 දක්වා අඩුවිය. මීට අමතරව,

ගෙවීම් ගිවිසුම් යටතේ වූ වෙළෙඳ භාණ්ඩ ගනුදෙනු වලින් ඒල ණය ඉක්මවා රුපියල් කෝටි 3·17 ක රන් පවුම් වාසියක් ලංකාවට අත් විය. 1964 අවසානයේදී ගෙවීම් ගිවිසුම යටතේ වූ භාණ්ඩ ගනුදෙනු වලින් ලංකාවට රුපියල් කෝටි 6·93 ක කෙටි කාලීන වගකීම් ඇතිවිය.

**ප්‍රාදේශීය ගනුදෙනු පිළිවෙළ**

සංඛ්‍යා සටහන II (ඊ) 4

**වර්තන ගිණුම්, මුදල් කලාප අනු**

(රුපියල් දශ ලක්ෂ)

| | 1964 | | | 1965 (තාවකාලික) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **1. ඩොලර් කලාපය** .. | 283·2 | 119·5 | +163·7 | 278·6 | 127·5 | +151·1 |
| **2. රන් පවුම් කලාපය** .. | 949·5 | 1,110·6 | —161·1 | 1,010·9 | 1,032·8 | — 21·9 |
| (i) එක්සත් රාජධානිය .. | 548·3 | 539·3 | + 9·0 | 557·4 | 485·6 | + 71·8 |
| (ii) ඉන්දියාව .. | 70·7 | 226·1 | —155·4 | 53·1 | 163·2 | —110·1 |
| (iii) අනෙකුත් .. | 330·5 | 345·2 | — 14·7 | 400·4 | 384·0 | + 16·4 |
| **3. ඩොලර් හෝ රන්පවුම් නොවනකලාප** | **798·8** | **961·8** | **—163·0** | **874·8** | **957·1** | **— 82·3** |
| (i) අනෙකුත් ආ. ස. සං. සං. රටවල් * .. | 191·6 | 252·7 | — 61·1 | 193·0 | 288·3 | — 95·3 |
| (ii) චීනය .. | 154·9 | 182·8 | — 27·9 | 183·9 | 136·4 | + 47·5 |
| (iii) සෝවියට් කලාපය .. | 163·8 | 210·1 | — 46·3 | 204·8 | 190·8 | + 14·0 |
| (iv) අනෙකුත් .. | 288·5 | 316·2 | — 27·7 | 293·1 | 341·6 | — 48·5 |
| **එකතුව** .. | 2,031·5 | 2,191·9 | —160·4 | 2,164·3 | 2,117·4 | + 46·9 |

* ඕස්ට්‍රියාව බෙල්ජියම, ඩෙන්මාර්කය, ප්‍රංසය, ජර්මන් සමූහාණ්ඩුව, ග්‍රීසිය, ඉතාලිය, නෙදර්ලන්තය, නෝර්වේ, පෘතුගාලය, ස්වීඩනය, ස්පාඤ්ඤය, හා ස්විට්සර්ලන්තය මෙයට අයත්වෙයි.

1965 දී ලංකාවේ වර්තන ගිණුමේ (ණය හා දීමනා ඇතුළුව) ප්‍රාදේශීය ගෙවුම් ශේෂයෙහි රුපියල් කෝටි 4·69 ක අතිරික්තයක් ඇතිවිය. 1964 දී එහි රුපියල් කෝටි 16·04 ක හිගයක් ඇති විය. 1965 වර්තන ගිණුම් ශේෂයෙහි ඇති වූ දියුණු වෙහි ප්‍රධාන ලක්ෂණයන් වූයේ රන් පවුම් කලාපය සමග වූ ශේෂයෙහි හිගය සැලකිය යුතු ප්‍රමාණයකින් පහල වැටීම හා ගෙවීම් ගිවිසුම් රටවල් සමග වූ වෙළෙඳ ශේෂය වාසි සහගත වීමය. ඩොලර් කලාපය සමග සිරිත් පරිදි ඇතිවන අතිරික්තය 1965 දී තව දුරටත් අඩු විය. 1964 දී රුපියල් කෝටි 16·37 ක් වූ එය 1965 දී ඩොලර් කෝටි 15·11 ක් විය. 1965 දී ඩොලර් කලාපයෙන් කැරුන ආනයනයන් ගේ වටිනාකම් වැඩි වුවද, විදේශාධාර වැඩිවීම නිසා එය බොහෝ දුරට ම සමානුපාතිකව හිලව් විය. එබැවින් එම කලාපය සමග කැරුන ගනුදෙනු අවාසි සහගත වීමට මුළුමනින් ම හේතු වී ඇත්තේ අපනයන ඉපැයුම් අඩුවීමය. රන් පවුම් කලාපය සමග වූ හිගය 1964 රුපියල් කෝටි 16·11 ක් විය. 1965 දී එය රුපියල් කෝටි 2·19 දක්වා පහල වැටිණි. මෙයට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ අපනයන ඉපැයුම් රුපියල් කෝටි 6·14 කින් රුපියල් කෝටි 101·09 දක්වා වැඩි වීමත්. ආනයන සඳහා ගෙවීම් රුපියල් කෝටි 7·78 කින්, රුපියල් කෝටි 103·28 දක්වා අඩුවීමත් ය. එක්සත් රාජධානිය සමග වූ වර්තන ගිණුම් අතිරික්තය 1964 රේ රුපියල් කෝටි 0·9 සිට 1965 දී රුපියල් කෝටි 7·18 දක්වා වැඩිවිය. මෙසේ වූයේ ප්‍රධාන වශයෙන්ම ආනයන ගෙවීම් රුපියල් කෝටි 5·37 කින් අඩු වීමත් සමග ම අපනයන ඉපැයුම් සුළු වශයෙන් වැඩිවීමේ හේතුවෙනි. ඉන්දියාව සමග වූ වෙළෙඳ ශේෂ හිගය ද රුපියල් කෝටි 4·53 කින් අඩු විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ අපනයන ඉපැයුම් රුපියල් කෝටි 1·76 කින් අඩු වූයේ වුවද, ආනයන

ගෙවුම් රුපියල් කෝටි 6·29 කින් අඩුවීමය. ගෙවීම් ගිවිසුම් ඇති රටවල් සමග කැරුන ගනුදෙනු වලින් 1965 දී රුපියල් කෝටි 6·15 ක අතිරික්තයක් ඇති විය. 1964 දී එම ගනුදෙනු වලින් රුපියල් කෝටි 7·42 හිඟයක් ඇති විය. චීනය සමග වූ වර්තන ගිණුම් ශේෂ අතිරික්තය රුපියල් කෝටි 4·75 ක් වූ අතර, සෝවියට් කණ්ඩායම සමග වූ අතිරික්තය රුපියල් කෝටි 1·4 ක් විය. 1964 හා සසඳන විට 1965 දී චීනයට කැරුන අපනයන රුපියල් කෝටි 2·9 කින් වැඩි වූ අතර, ආනයන ගෙවීම් රුපියල් කෝටි 4·64 කින් අඩු විය. සෝවියට් කණ්ඩායමට කැරුන අපනයන වලින් ඉපැයුම් රුපියල් කෝටි 4·1 කින් වැඩි වූ අතර, ආනයන ගෙවීම් රුපියල් කෝටි 1·93 කින් අඩු විය. ආර්ථික සහයෝගතා හා සංවර්ධන සංවිධානයේ රටවල් සමග කැරුන ගනුදෙනු වලින් 1964 දී ඇති වූ රුපියල් කෝටි 6·11 ක හිඟය හා සසඳන විට 1965 දී ඇති වූ හිඟය රුපියල් කෝටි 9·53 ක් විය. මෙසේ වීමට ප්‍රධාන සාධකය වූයේ, ආනයන ගෙවීම් රුපියල් කෝටි 3·56 කින් (මෙයින් 1/3 ක් පමණ විදේශාධාර මගින් කැරුන ආනයන වලින් සමන්විත විය) වැඩි වීමය.

**විදේශීය සංචිත**

1965 දී ලංකාවේ (දළ) විදේශීය වත්කම් රුපියල් කෝටි 8·89 කින් රුපියල් කෝටි 43·99 ක් දක්වා වැඩි විය. රන් පවුම් ණය නිදන් අරමුදල් හැර 1965 අවසානයට පැවැති විදේශීය වත්කම් ප්‍රමාණයට රුපියල් කෝටි 40·8 ක් විය. 1964 අවසානයට මෙය රුපියල් කෝටි 30·5 ක් විය. 1964 අවසානයේ දී පැවැති (දළ) විදේශීය වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 35·1 ක් විය. 1965 මුල් කාර්තුව තුළ දී මේ වත්කම් රුපියල් කෝටි 0·97 කින් පහළ වැටිණි. මෙසේ වූයේ විදේශයන්ගෙන් රුපියල් කෝටි 5·12 ක් ණයට ද ගෙන තිබියදීය. කෙසේ වුවද, 1965 දෙවැනි කාර්තුවේ දී ප්‍රධාන වශයෙන් ම, ආනයන ගෙවීම් අඩුවීමේ හේතුවෙන් (දළ) විදේශීය වත්කම් රුපියල් කෝටි 1·01 කින් වැඩි විය. 1965 තුන්වැනි කාර්තුවේදී ද විදේශීය වත්කම් නොකඩවා වැඩි විය. මෙයට බොහෝ දුරට ම හේතු වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් රුපියල් කෝටි 7·13 ක් ගැනීමත්, ලාභ හා ලාභාංශ කල් තැබීමේ බලය හේතු කොට ගෙන ප්‍රේෂණ අඩුවීමත්, ආනයන බලපත්‍ර නිකුත් කිරීම පමාවීමෙන් වෙළෙඳ භාණ්ඩ ශේෂය වාසිදායක බවට හැරීමත් ය. මේ අනුව 1965 තුන් වැනි කාර්තුව අවසන් වන විට ලංකාවේ (දළ) විදේශීය වත්කම් රුපියල් කෝටි 16·53 කින් වැඩි වී තිබිණි. එහෙත්, 1965 සතර වැනි කාර්තුවේ දී කරුණු කිපයක් හේතු කොට ගෙන, විදේශීය වත්කම් රුපියල් කෝටි 7.64 කින් පහළ වැටීමත් සමග තත්ත්වය අනික් අතට හැරිණි. මෙහිලා මූලික වූයේ රුපියල් කෝටි 2·46 ක රන් පවුම් ණය ආපසු ගෙවීමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් රුපියල් කෝටි 1·79 ක් නැවත මිලයට ගැනීමත්ය. දෙ වැනිව 1965 දෙ වැනි භාගය තුළ දී ආනයන බලපත්‍ර නිකුතුව වැඩිවීමෙන් ද, වෙළෙඳ භාණ්ඩ සඳහා ගෙවීම් වැඩිවිය. අවසාන වශයෙන් 1965 අවසාන කාර්තුවේ දී ගෙවීම් ගිවිසුම් පැවැති රට වලට ප්‍රධාන වශයෙන් ම තෙල් ආනයන සඳහා වූ පමා වී තුබූ ගෙවීම් වලින් සෑහෙන ප්‍රමාණයක් බේරන ලදි. මෙකී සාධක හේතු කොට ගෙන, 1965 වසර තුළ විදේශීය වත්කම්හි ඇති වූ සාමාන්‍ය දියුණුව තරමක් දුරට වෙනස්ව ගියේය.